

LH

# 12

## සාර්ථක ඡායාරූපයක් සඳහා පැහැදිලි මගක් දැක්විය හැකිද?

මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ ලෙහෙසියෙන් පිළිතුරු සොයා ගත හැකි මාතෘකාවක් නොවේ. නමුත් මේ සඳහා වෑයමක් දැරීම ම වටිනා පියවර යයි සිතමු. සංක්ෂිප්ත ව කරුණු දක්වා ඇති අතර පුද්ගලික ව හැදෑරීමත්, කරුණු එකතු කිරීමත්, ඡායාරූප ශිල්පය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිස් සමග සාකච්ඡාවට භාජනය කිරීමෙනුත්, වඩා ප්‍රයෝජනයක්ද ලබාගත හැකි ය. සාකච්ඡාවට ළඟා විය හැකි එක් වක්‍ර මාර්ගයක් වන්නේ, සාර්ථක ඡායාරූපයක් සඳහා යම් ප්‍රවීණ ඡායාරූප ශිල්පියෙක් කටයුතු කරන ආකාරය විභාගකර බැලීමයි' මේ සඳහා පහත සඳහන් මූලික කරුණු දහය වෙත ඔබේ අවධානය යොමු කරන්නෙමි.

1. ඔහු දියුණු කරන ලද ලෝක ඥානයෙන් යුක්ත කෙනෙකු විය.
2. ඡායාරූප ශිල්පය හදාරා ඡායාරූප ඥානය වඩවාගත් කෙනෙකු විය.
3. සුදුසු උපකරණ ඔහු සතු විය.
4. උපකරණ භාවිතය මනාව ප්‍රගුණ කර තිබුනි.
5. සාර්ථක ඡායාරූපයක් නිමාකර ගැනීම පිළිබඳ මහත් වූ අභිලාශයෙන් යුක්ත වූවෙකු විය.
6. ඡායාරූප ගැන්ම සඳහා සුදුසු තැන්වලට යාමට කාලය මෙන්ම වියදම දැරීමට ඔහුට හැකි විය.
7. නිවැරදි රූපරාමුව තෝරා ගැනීම පිළිබඳ පරිචයක් ද නිවැරදි මෙහොතේ ඡායාරූප ගැනීම සඳහා අවශ්‍ය ඉවසීම ද, සන්සුන් බව ද, ඔහු සතුව තිබුණි.
8. අවසාන රූප රාමුව තෝරාගත් පසු එය ඉතා නිවැරදි ව සටහන්